ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

Flexi Investor ගිණුම				
නිමැවුමේ ස්වභාවය	**ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ**	**ආරම්භක තැන්පතු හා ගාස්තු**	**සුදුසුකම**	**ප්‍රධාන නියම හා කොන්දේසි**
ගනුදෙනුකරු කැමති ආකාරයට සිය ඉලක්ක සපුරාගැනීම සඳහා පිරිනැමෙන ඉලක්ක පදනම් කරගත් ආයෝජන ගිණුම කි.	• ඉලක්කය, කාල සීමාව හා දැරියහැකි තැන්පතු මුදල මත පදනම්ව ඔබටම ආවේණික ආයෝජන සැලැස්මක් සකස්කරගැනීමට මගපාදනු ලැබේ. • විවිධ ආකාරයේ ආයෝජන අවස්ථා • ආකර්ශනීය පොලී අනුපාත නවතම පොලී අනුපාත බලාගැනීමට https://www.boc.lk/ratestariff#rupeedeposit-rates වෙත පිවිසෙන්න. • අතපසු වූ තැන්පතු සඳහා දඩ මුදලක් අය නොකෙරේ. • ඩිජිටල් මාධ්‍ය හරහා පහසුවෙන් පරීක්ෂාකිරීමේ හැකියාව	• **ආරම්භක තැන්පතුව** – තෝරාගත් Flexi Investor ආයෝජන සැලැස්ම් මත මෙය පදනම් වේ. • **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු** ගාස්තු දැනගැනීමට https://www.boc.lk/ratestariff#general-tariff වෙත පිවිසෙන්න. • **බදු** - පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යස්ථාපිත අයබදුවලට යටත් වේ.	✓ මෙම ගිණුම විවෘත කළ හැකිය. - වයස අවුරුදු 18 හෝ ඊට වැඩි ශ්‍රී ලාංකික නේවාසිකයන්ට; - විදේශ රටවල සේවයේ නියුතු ශ්‍රී ලංකාවේ අනේවාසික (විගාමිකයන් හැර) වයස අවුරුදු 18 හෝ ඊට වැඩි තැනැත්තන්ට, ✓ Flexi Investor ගිණුමක් විවෘතකිරීමට ආරම්භක තැන්පතුව සඳහා සහ කල්පිරුණු පසු මුදල් මාරුකිරීම සඳහා ලංකා බැංකුවේ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉතුරුම් හෝ ජංගම ගිණුමක් තිබීම පූර්ව අවශ්‍යතාව කි. ✓ කල්පිරීමේදී මෙම ගිණුම් ස්වයංක්‍රීයව වසාදැමෙන අතර මුදල් මුල් ගිණුමට මාරුකරනු ලැබේ. ✓ නේවාසික හෝ අනේවාසික යන කාණ්ඩ වලින් එකම කාණ්ඩයට අයත් පාර්ශ්වයන් සමග බද්ධ ගිණුම් විවෘත කළ හැකිය. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** ✓ බැංකු වෙබ් අඩවියේ ඇති **'BOC Flexi Investor Calculator'** යොදාගෙන ඉලක්ක ගත මුදල (කල්පිරීමේදී ඇති මුදල) ළඟාකරගැනීමට අවශ්‍ය මාසික වාරිකය හෝ එකවර ගෙවන මුදල ගණනය කළහැකිය. ✓ බැංකුවේ වෙබ් අඩවියේ ඇති **'Apply Online'** හරහා ගිණුම් විවෘතකිරීමේ ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය ලේඛන: BOC Flexi Investor ගිණුම විවෘතකිරීමේ අයදුම්පත **නේවාසිකයන් සඳහා** - ජාතික හැඳුනුම්පතේ (NIC) පිටපතක් / NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්; - ලිපිනය තහවුරුකිරීමේ ලේඛනයේ පිටපතක් (මෙය අවශ්‍ය වන්නේ අයදුම්පතේ සඳහන් ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම් පමණි); - ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක්, **අනේවාසිකයන් සඳහා** - අයදුම්කරුගේ විදේශ ගමන් බලපත්‍රයේ විස්තර සඳහන් පිටුවේ පිටපතක් - වලංගු වීසා බලපත්‍රයේ පිටපතක් හෝ රැකියාව තහවුරුකිරීම සඳහා අදාළ ලේඛනමය සාක්ෂි	- පවතින ශේෂය ඇපයට තබා ණයක් ලබාගත හැක්කේ, ස්ථිර පොලී අනුපාතය යටතේ විවෘත කරන ලද ගිණුම්වලට පමණි. - නිමැවුමට අදාළ සියලුම නියම හා කොන්දේසි දැනගැනීම සඳහා ගිණුම විවෘතකිරීමේ අයදුම්පත බලන්න. - කල්පිරීමට පෙරාතුව මුදල් ආපසුගැනීමේදී සාමාන්‍ය ඉතුරුම් පොලී අනුපාතය අදාළ වේ.

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා ප්‍රමුඛතාව පදනම් කොටගෙන සලකා බලනු ලැබේ.
- **දුරකතන:** +94 11 220 4750 / +94 11 243 5814 **ෆැක්ස්**: +94 11 243 5815 **විද්‍යුත් ලිපිනය**: bocexmgt@boc.lk **වෙබ් අඩවිය:** https://www.boc.lk **තැපෑල:** ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු , 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.
- අපගේ කුමන හෝ ශාඛාවක්, සේවා ඒකකයක්, හෝ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.

Classification: Internal

Classification: Internal